HUMAN RIGHTS WATCH

# ශ්‍රී ලංකාව : බරපතල අතවරයන්ට මුහුණදෙන සංක්‍රමණික කාන්තාවෝ

*මැදපෙරදිග සේවය කරන ගෘහ සේවිකාවෝ ප්‍රචණ්ඩත්වයට සහ ශ්‍රම සූරාකෑමට ගොදුරුවෙති*

(2007 නොවැම්බර් 14 වෙනිදා, කොළඹ ) - ගෘහ සේවිකාවන් ලෙස සේවය කිරීම සඳහා මැදපෙරදිග බලායන කාන්තාවන් ශ්‍රම සූරාකෑමට සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීමෙන් වලක්වාගැනීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව දැනට වඩා පියවර ගතයුතු බව හියුමන් රයිට්ස් වොච් සංවිධානය අද නිකුත්කල වාර්තාවක සඳහන්කරයි. 660,000කට අධික ශ්‍රී ලාංකික කාන්තාවන් ගෘහ සේවිකාවන් ලෙස විදේශයන්හි සේවය කරන අතර, එයින් සියයට 90ක් පමණම සේවය කරන්නේ ගෘහ සේවිකාවන්ට නීතියෙන් පහැදිලි රැකවරණයක් නොලැබෙන සවුදි අරාබිය, කුවේටය, ලෙබනනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවලය.

සංක්‍රමණික ක්‍රියාදාමයේ සෑම අදියරකදීම ගෘහ සේවිකාවන් මුහුණපාන බරපතල අතවරයන් පිලිබඳ සවිස්තර වාර්තාවක් "අපනයනයකොට අපහරණයට ලක්කිරීම : සවුදි අරාබිය, කුවේටය, ලෙබනනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් මුහුණදෙන අතවර," මැයෙන් යුත් පිටු 131 ක මෙම වාර්තාවට ඇතුලත්වේ. ශ්‍රී ලංකා ආණ්ඩුව මෙන්ම මැදපෙරදිග රටවල්ද මෙම කාන්තාවන්ට ආරක්ෂාව සැපයීමට අපොහොසත්වී ඇති අන්දම වාර්තාවට ඇතුලත්ය. ගෘහ සේවිකාවන්, ආණ්ඩුවේ නිලධාරීන් සහ රකියා ඒ'ජන්සිකරුවන් 170 දෙනෙකු සමඟ ශ්‍රී ලංකාවේදී සහ මැදපෙරදිගදී පවත්වන ලද සම්මුඛ සාකච්චා පදනම්කොටගෙන මෙම වාර්තාව සකස්කොට තිබේ.

"මෙම කාන්තාවන් සියරට එවන මුදල් සාදරයෙන් පිලිගන්නා නමුත් ශ්‍රී ලංකා ආණ්ඩුව ඔවුන් අතවරවලින් බේරාගැනීම සඳහා ප්‍රමාණවත් පියවරක් නොගනී" යයි හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ කාන්තා අයිතිවාසිකම් අංශයේ පර්යේෂිකාවක වන, වාර්තාවේ කතුවරිය ජෙනිෆර් ටර්නර් පවසයි. "ශ්‍රී ලංකාවේදී රැකියා ඒ'ජන්සිකරුවන් ප්‍රමාණවත් පාලනයකට නතුනොකිරීම සහ විදේශයන්හිදී තානාපති කාර්යාලවලින් නිසි ආරක්ෂාවක් නොලැබීම නිසා ශ්‍රී ලාංකික සේවකයන් ප්‍රචණ්ඩත්වයට සහ ශ්‍රම සූරාකෑමට ගොදුරුවීමේ අනතුර උත්සන්නවී තිබේ".

කම්කරුවන් අපනයනය කරන පිලිපීනය වැනි අනෙක් ආසියානු රටවල් තරම් ප්‍රමාණවත් ආරක්ෂණයක් රැකියා සඳහා විදේශගතවන තම පුරවැසියන්ට ශ්‍රී ලංකාව ලබානොදෙයි. විදේශගතවීමට බලාපොරොත්තුවන සේවිකාවන් ශ්‍රී ලංකාවේ රැකියා ඒ'ජන්සිකරුවන් සහ ඔවුන්ගේ උප නියෝජිතයන්ගේ අතවරයට ලක්වීමේ ක්‍රියාදාමයන් නිරීක්ෂණය කොට එය පාලනය කිරීමට ආණ්ඩුව අපොහොසත්වී ඇත. පඩි නොගෙවීම හෝ සේවාදායකයාගේ අතවරයට ලක්වීම පිලිබඳව පැමිණිලි රැගෙන එන ගෘහ සේවිකාවන්ට තානාපති කාර්යාල නිළධාරීන්ගෙන් බොහෝවිට සහණයක් නොලැබේ. යලි සියරට පැමිණි සේවිකාවන් අතවර

සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට උත්සාහ දරන අවස්ථාවලදී බොහෝ බාධකවලට මුහුණදීමට සිදුවන අතර, ආපසු පැමිණෙන සේවිකාවන් සඳහා ජාත්‍යන්තර ගුවන් තොටුපොල ආසන්නයේ පිහිටුවා ඇති රැකවරණ මධ්‍යස්ථානයේදී සැලසෙන සේවයද ප්‍රමාණවත් නැත.

සංක්‍රමණික සේවකයන් බරපතල ණයබරකට ඇදදමමින් ශ්‍රී ලංකාවේ රැකියා ඒ'ජන්සිකරුවන් ඔවුන්ගෙන් අතිවිශාල මුදල් අයකරන බව හියුමන් රයිට්ස් වොච් සංවිධානයට අනාවරණය වු අතර, මේ ඒ'ජන්සිකරුවන් බොහෝවිට සංක්‍රමණිකයන්ට රැකියා පිලිබඳ සත්‍ය තොරතුරුද ලබානොදේ. රැකියාවට ගියපසු, පැයකට ඇමෙරිකානු ඩොලර්වලින් සත 15ත් 30ත් අතර ඉතාම අඩු පඩියකට, කිසිදු විවේකයක් හෝ නිවාඩු දිනයක් නොමැතිව දිනකට පැය 16ත් 20ත් අතර කාලයක් වැඩකිරීමට ඔවුන්ට සිදුවේ. ඇතැම් හාම්පුතුන් තමන් ලිංගික අතවරවලට සහ දූෂණයට ලක්කළ බවත්, බලහත්කාරයෙන් වැඩගත් බවත්, ඇතැම් හාම්පුතුන්ගේ පහරදීම් සහ බැනවැදීම්වලට තමන්ට මුහුණදීමට සිදුවූ බවත්, ඇතැම්විට ආහාර පවා ලබානොදී සිරකොට තැබූ බවත් ඇතැම් ගෘහ සේවිකාවෝ හියුමන් රයිට්ස් වොච් සංවිධානයට පැවසූහ.

සවුදි අරාබිය, කුවේටය, ලෙබනනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ කම්කරු නීති මගින් කම්කරු වන්දි, දවසේ වැඩකරණ පැයගණන සීමාකිරීම, සතියකට දිනක නිවාඩුවක්, පඩි සහිත නිවාඩු වැනි රටේ අනෙක් කම්කරුවන්ට ලැබෙන සියලු කම්කරු අයිතිවාසිකම්වලින් සංක්‍රමණික ගෘහ සේවිකාවන් ඉවත්කොට තිබේ. ඒ' වෙනුවට, කුවේටයේදී සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී ගෘහ සේවිකාවන්ට පමණක් අදාලවන රැකියා කොන්ත්‍රාත්තු ක්‍රමයක් යටතේ ඊට වඩා ඉතා දුර්වල වෙනමම ආරක්ෂණ ක්‍රමයක් ඔවුන්ට සලසාදී තිබේ.

"නීතිමය ආරක්ෂණයේ මෙවැනි සිදුරු පැවතීම සහ සාධාරණය ඉටුකරගැනීමට පවතින බාධා හේතුවෙන් අතවරයට ලක්වන බොහෝ ශ්‍රී ලාංකික කාන්තාවෝ සාධාරණය ඉටුවීම පිලිබඳ බලාපොරොත්තුවකින් තොරවම ආපසු සියරට බලා එති"යි ජෙනිෆර් ටර්නර් පවසයි. " සවුදි අරාබිය, කුවේටය, ලෙබනනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ආණ්ඩු ගෘහ සේවිකාවන්ට අතවර කරන හාම්පුතුන් නීතිය ඉදිරියට පැමිණවිය යුතුය. එමෙන්ම නීතිය උල්ලංඝණය කරන හාම්පුතුන් සහ රැකියා ඒ'ජන්සිකරුවන්ට එරෙහිව ප්‍රබල සිවිල් සහ අපරාධ සම්බාධක පැණවීමටද එම ආණ්ඩු ක්‍රියාකළයුතුය".

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හඳුන්වාදෙන ලද ප්‍රතිසංස්කරණ කිහිපයක් පිලිබඳව හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ ප්‍රසාදය පලවේ. සංක්‍රමණික සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇතිකිරීම සහ පසුගිය ඔක්තෝබර් මාසයේදී නිවේදනය කරන ලද යලි සියරට පැමිණෙන සංක්‍රමණික සේවකයන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් ලබාදීමේ වැඩසටහනද මෙයට ඇතුලත්ය.

සංක්‍රමණික කාන්තාවන් ආරක්ෂාකිරීම සඳහා තවදුරටත් පියවර ගන්නා මෙන් හියුමන් රයිට්ස් වොච් සංවිධානය ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ඉල්ලා සිටියි. කාන්තාවන් විදේශගතවීමට ප්‍රථම තම අයිතිවාසිකම් පිලිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් දියත්කොට ඔවුන්ට ප්‍රමාණවත් පුහුණුවක් ලබාදෙන මෙන් සහ රැකියා ඒ'ජන්තවරුන් හා ඔවුන්ගේ උප නියෝජිතයන් පාලනයකට නතුකිරීමට මෙන්ම එම නියෝජිතයන්ගේ

ක්‍රියාකාරකම් පිලිබඳව නිරන්තරයෙන් නිරීක්ෂණය කිරීමට පියවර ගන්නා මෙන් හියුමන් රයිට්ස් වොච් සංවිධානය විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටී. ගෘහ සේවිකාවන් අර්බුදයකට මුහුණදුන් අවස්ථාවකදී තානාපති කාර්යාල මගින් දැනට වඩා වැඩි සේවාවක් ලබාදීමට ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය කටයුතුකළයුතුය. යලි සියරට පැමිණෙන ගෘහ සේවිකාවන්ට පැමිණිලි කිරීම සඳහා සලසාදී ඇති යාන්ත්‍රනයන් පුලුල් කිරීමට කටයුතු කළයුතුය.

ගෘහ සේවිකාවන්ටද තම රටවල බලපවත්නා කම්කරු නීතිවල රැකවරණය ලබාදෙන ලෙසත්, ගෘහ සේවිකාවන්ට තම සේවාදායකයා මාරුකිරීම දුෂ්කර කරන සංක්‍රමණික නීති සංශෝධනය කරන ලෙසත්, අතවරයන්ට ලක්වන කාන්තාවන්ට වන්දි ලබාදීම සහතික කරන ලෙසත් හියුමන් රයිට්ස් වොච් සංවිධානය සවුදි අරාබියේ, කුවේටයේ, ලෙබනනයේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ආණ්ඩුවලින් ඉල්ලා සිටී.